සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ආර්ථික විද්‍යාව - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම දි ඇති පිළිතුරු 5 න් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය වරහන් තුළ වූ තිත් ඉරි මත ලියන්න.

---

(01) නිෂ්පාදන සම්පත්වල 'අජීවී සම්පත්' ලෙස අර්ථ දැක්විය හැක්කේ,

(1) භූමිය හා එහි අන්තර්ගත සියළුම නිෂ්පාදන සම්පත්
(2) භූමිය හා එහි අන්තර්ගත සියළුම ස්වභාවික සම්පත්
(3) නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිතයත් සමග නැවත ප්‍රතිජනනය වන ස්වභාවික සම්පත්
(4) නිෂ්පාදන ක්‍රියාවලියේදී අසීමිත සැපයුමක් සහිත නිෂ්පාදන සම්පත්
(5) නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිතයක් සමග නැවත ප්‍රතිජනනය නොවන ස්වභාවික සම්පත් (........)

(02) ඕනෑම ආර්ථිකයක පොදු කේන්ද්‍රීය ආර්ථික ප්‍රශ්නයක් ලෙස සැලකිය හැක්කේ,

(1) රාජ්‍ය ත්‍රස්තවාදය පිළිබඳ ගැටළුව
(2) මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව සම්පත් සීමාසහිත වීමේ ගැටළුව
(3) රාජ්‍ය ව්‍යවසායකත්වයේ දක්නට ලැබෙන වංචා හා දූෂණ ගැටළුව
(4) ස්වභාවික සම්පත් අධි උපයෝජනය පිළිබඳ ඇති ගැටළුව
(5) ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍යය අයෝජ්‍ය ප්‍රමාණවත් නොවීමේ ගැටළුව (........)

(03) ආර්ථික පද්ධතිය මූලික කාර්යභාරයක් ලෙස දැක්විය හැක්කේ,

(1) සම්පත් බෙදීයාමේ යාන්ත්‍රණය කාර්යක්ෂම කිරීම.
(2) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමට ක්‍රියා කිරීම.
(3) ජනතාවගේ ආරක්ෂාව හා නිදහස තහවුරු කිරීම හා ආරක්ෂා කිරීම.
(4) ආර්ථිකයේ අභ්‍යන්තර හා බාහිර ස්ථායිතාවය තහවුරු කිරීම.
(5) ජාත්‍යන්තර සහයෝගීතාවය තහවුරු කර ගැනීම. (........)

(04) නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ රටේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය $A^1A^1$ සිට $B^1B^1$ දක්වා විතැන්විය. එසේ විය හැක්කේ,




(1) යෙදවුම්වල පලදායිතාවය ඉහළයාමක්
(2) භාණ්ඩයේ මුළු ඉල්ලුම දකුණට විතැන්වීමක්
(3) භාණ්ඩයේ මුළු සැපයුම දකුණට විතැන්වීමක්
(4) නිෂ්පාදන පලදායිතාවයේ පහළ වැටීමක්
(5) විදේශ රැකියා කරා යන සේවා නියුක්තිකයන්ගේ ඉහළ යාමක් (........)

(05) 'ආවස්ථික පිරිවැයක්' සහිත භාණ්ඩයක් සම්බන්ධයෙන් කියවෙන සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) භාණ්ඩය නොමිලේ ලබාදීම.
(2) භාණ්ඩයට මිලක් නියම වී තිබීම.
(3) සම්පත්වල කැපකිරීමක් නොමැතිකම.
(4) භාණ්ඩයේ හිඟයක් දක්නට ලැබීම.
(5) වෙළඳපොළේ හුවමාරුවක් තිබීම. (........)

www.artsapi.lk

(06) නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය යන්න වඩාත් හොඳින් අර්ථය පැහැදිලි වන්නේ කුමන ප්‍රකාශය මගින්ද?
(1) ආර්ථිකයේ පූර්ණ නිෂ්පාදන මට්ටම
(2) ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්තිය
(3) භාණ්ඩ දෙකක් පමණක් වඩා කාර්යක්ෂම නිෂ්පාදනය
(4) සියළුම නිෂ්පාදන සම්පත් පූර්ණ ලෙස භාවිත කිරීම.
(5) අවම යෙදවුම් ප්‍රමාණයකින් උපරිම නිමැවුම් ප්‍රමාණයක් නිපදවීම. (........)

(07) ආර්ථිකයේ කාර්යක්ෂමතාවය අත්පත් කර ගැනීමට නම් ඉටුවිය යුතු කොන්දේසි වන්නේ,
(1) පූර්ණ සේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනය
(2) නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය හා සම්පත් බෙදාහැරීමේ කාර්යක්ෂමතාව
(3) නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව හා පූර්ණ නිෂ්පාදනය
(4) සම්පත් බෙදාහැරීමේ කාර්යක්ෂමතාව හා පූර්ණ නිෂ්පාදනය
(5) සම්පත් බෙදාහැරීමේ කාර්යක්ෂමතාව හා පූර්ණ සේවා නියුක්තිය (........)

(08) ආර්ථික විද්‍යාවේදී 'නොමිල සම්පත්' අර්ථ දක්වා ඇත්තේ,
(1) නිෂ්පාදන ක්‍රියාවලියේදී අසීමිත සැපයුමක් සහිත සම්පත්
(2) නිෂ්පාදන ක්‍රියාවලියේදී සීමා සහිත සැපයුමක් සහිත සම්පත්
(3) නිෂ්පාදන ක්‍රියාවලියේදී නැවත නැවත ප්‍රතිජනනය නොවන සම්පත්
(4) සාධක වෙළඳපොළේ හුවමාරුවන නිෂ්පාදන සම්පත්
(5) කෘත්‍රිමව සකස් කරගනු ලබන සමහර ස්වභාවික සම්පත් (........)

(09) එක්තරා වෙළඳපොළක x භාණ්ඩයේ මිල 10% ඉහළ ගිය අතර, ඉල්ලුම 5% කින් අඩුවිය. x භාණ්ඩය සම්බන්ධයෙන් සැපයුම්කරුගේ අයභාරය වැඩිවිය හැක්කේ,
(1) 3 % (2) 2 % (3) 0.5 % (4) 4.5 % (5) 5 % (........)

(10) එක්තරා වෙළඳපොළක 'දුම්වැටි' සඳහා ඇත්තේ නම්‍ය ඉල්ලුමක් නම් එම භාණ්ඩයේ මිල පහල ගිය විට,
(1) පාරිභෝගික පැහැදම ඉහළ යයි.
(2) පාරිභෝගික පැහැදම පහළ යයි.
(3) සැපයුම්කරුගේ අයභාරය පහළ යයි.
(4) සැපයුම්කරුගේ අයභාරයේ වෙනසක් සිදු නොවේ.
(5) පාරිභෝගික ඉල්ලුමේ වෙනසක් සිදු නොවේ. (........)

(11) භාණ්ඩයේ මිල වෙළඳපොළ ඉල්ලුම් වක්‍රයට හා සාමාන්‍ය අයභාර වක්‍රයට සමාන අවස්ථාවක් දැකිය හැකි වෙළඳපොළකි.
(1) පූර්ණ තරගකාරී වෙළඳපොළක (2) සාධක වෙළඳපොළක
(3) භාණ්ඩ හා සේවා වෙළඳපොළක (4) ඒකාධිකාරී වෙළඳපොළක
(5) ඒකාධිකාරී තරග වෙළඳපොළක (........)

(12) රජය පනවන ලද දේශීය භාණ්ඩ බද්දක් සම්පූර්ණයෙන්ම පාරිභෝගිකයාට දැරීමට සිදුවන අවස්ථාවක් ලෙස දැක්විය හැක්කේ,
(1) ඉල්ලුම පූර්ණ නම්‍ය වීම හා සැපයුම පූර්ණ අනම්‍ය වූ අවස්ථාවකදීය.
(2) ඉල්ලුම පූර්ණ අනම්‍ය හා සැපයුම පූර්ණ නම්‍ය වූ අවස්ථාවකදීය.
(3) ඉල්ලුම පූර්ණ අනම්‍ය හා සැපයුම නම්‍ය වූ අවස්ථාවකදීය.
(4) ඉල්ලුම පූර්ණ අනම්‍ය හා සැපයුම අනම්‍ය වූ අවස්ථාවකදීය.

www.artsapi.lk

(5) සැපයුම පූර්ණ නම්‍ය හා ඉල්ලුම පූර්ණ නම්‍ය වූ අවස්ථාවකදීය. (........)

(13) 'සැපයුම් වක්‍රය' අනුලෝම සම්බන්ධතාවයක් ගනු ලබන්නේ,

(1) භාණ්ඩයේ මිල ස්ථාවර වීම හා සැපයුම් සාධක වෙනස් වීම මතයි.

(2) සැපයුමට බලපාන සියළුම සාධක වෙනස්වීම මතයි.

(3) භාණ්ඩයේ මිල හා සැපයුම අතර ප්‍රතිලෝම සම්බන්ධය නිසා ය.

(4) භාණ්ඩයේ මිල හා සැපයුම අතර සම්බන්ධයක් නැති නිසාය.

(5) භාණ්ඩයේ වැඩිවන ආවස්ථික පිරිවැය නීතියට අනුව නිසාය. (........)

(14) වෙළඳපොළ ආර්ථික පද්ධතියක ලක්ෂණයක් වන්නේ,

(1) සම්පත්වල අයිතිය රාජ්‍ය සතුවීම.

(2) සම්පත්වල අයිතිය රාජ්‍ය හා පෞද්ගලික අංශය සතුවීම.

(3) මූලික ආර්ථික ප්‍රශ්න මධ්‍යගත සැලසුම් යන්ත්‍රණ මගින් විසඳීම.

(4) මිල යාන්ත්‍රණය මගින් ආර්ථිකය මෙහෙයවීම.

(5) රජයේ කාර්ය භාරය අසීමිත වීම. (........)

(15) වෙළඳපොළ ආර්ථිකය 'ලාභය' මගින් සිදුකරන කාර්යයක් වන්නේ,

(1) වෙළඳපොළට සංඥා සැපයීම.

(2) යටිතල පහසුකම් සපයා දීම.

(3) පොදු භාණ්ඩ සපයා දීම.

(4) ශුභ සාධන භාණ්ඩ සපයා දීම.

(5) ඉහත සාධක සියල්ලම. (........)

(16) නිෂ්පාදන ආයතනයක නිපදවන භාන්ඩයක් සම්බන්ධව මුළු පිරිවැය දත්ත ඔබට සපයා ඇත.

| නිමැවුම | විචල්‍ය පිරිවැය | මුළු පිරිවැය |
|---|---|---|
| 0 | - | |
| 1 | 70 | 170 |
| 2 | 110 | 210 |
| 3 | 140 | 240 |
| 4 | 160 | 260 |
| 5 | 210 | 310 |

ඉහත නිෂ්පාදන ආයතනයේ ස්ථාවර පිරිවැය හා 4 වන භාණ්ඩ ඒකකයේ සාමාන්‍ය මුළු පිරිවැය (ATC) පිළිවෙලින් ප්‍රකාශ වන්නේ,

(1) රු.මි. 100 හා රු. මි. 20

(2) රු.මි. 65 හා රු. මි. 100

(3) රු.මි. 100 හා රු. මි. 65

(4) රු.මි. 100 හා රු. මි. 40

(5) රු.මි. 20 හා රු. මි. 100 (........)

(17) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක x භාණ්ඩයක් නිෂ්පාදන සම්බන්ධව මුළු පිරිවැය (TC) මුළු අයභාරයට (TR)සමාන වන මට්ටමක දී පැහැදිලි වන්නේ,

(1) ආර්ථික අලාභ ලබන මට්ටමක ආයතනය සිටින බව.

(2) ප්‍රාමාණික අලාභ ලබන මට්ටමක ආයතනය සිටින බව.

(3) ප්‍රමාණික ලාභ ලබන මට්ටමක ආයතනය සිටින බව.

(4) නිෂ්ප්‍රමාණික ලාභ ලබන මට්ටමක ආයතනය සිටින බව.

(5) ආර්ථික ලාභ උපරිම කරන නිමැවුම් මට්ටමක ආයතනය සිටින බව. (........)

www.artsapi.lk

(18) නිෂ්පාදන න්‍යාය අනුව 'කෙටිකාලීන නිෂ්පාදන' ක්‍රියාවලියේදී දක්නට ලැබෙන ලක්ෂණය වන්නේ,

(1) සියළුම සාධක විචල්‍ය සාධක බවට පත් වේ.

(2) සියළුම සාධක ස්ථාවර සාධක බවට පත්වේ.

(3) නිෂ්පාදනය ශුන්‍ය මට්ටමේදී ස්ථාවර පිරිවැය ශුන්‍ය වීම.

(4) නිෂ්පාදනය ශුන්‍ය මට්ටමේදී විචල්‍ය පිරිවැය ශුන්‍ය වීම.

(5) නිෂ්පාදනය ශුන්‍ය වූ විට ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැය යන පිරිවැය ශුන්‍ය වීම. (........)

(19) පහත සඳහන් ප්‍රකාශ අතුරින් 'හීනවන පලදා' න්‍යාය වඩාත් හොඳින් අර්ථ දක්වා ඇත්තේ කුමන ප්‍රකාශය මගින්ද?

(1) ස්ථාවර හා විචල්‍ය සාධක වැඩිකරන විට නිමැවුම ක්‍රමයෙන් වැඩි වෙන අතර, ආන්තික පිරිවැය ද ක්‍රමයෙන් පහළ බසී.

(2) විචල්‍ය සාධක වැඩිකරන විට ආන්තික පලදාව ක්‍රමයෙන් පහළ වැටෙන අතර ආන්තික පිරිවැය ද ක්‍රමයෙන් වැඩි වේ.

(3) ආන්තික පලදාව ක්‍රමයෙන් ඉහළ යන අතර ආන්තික පිරිවැය ද ක්‍රමයෙන් ඉහළ නගින බවයි.

(4) සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය පහළ යන අතර, ආන්තික පලදාව ද ක්‍රමයෙන් ඉහල නගින බවයි.

(5) ආන්තික පිරිවැය ක්‍රමයෙන් පහල බසින අතර ආන්තික පලදාවද ක්‍රමයෙන් පහල බසින බවයි.

(........)

(20) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියට අනුව නිෂ්පාදන ආයතනයක අදාළ භාණ්ඩය සම්බන්ධව ආන්තික පිරිවැය ආන්තික අයභාරයට සමාන විය. මෙයින් පැහැදිලි වන්නේ,

(1) ආයතනය ආර්ථික ලාභ උපරිමය කරා ළඟා වී ඇති බවයි.

(2) ආයතනය ආර්ථික අලාභ ලබන මට්ටමට ළඟා වී ඇති බවයි.

(3) ආයතනයේ මුළු පිරිවැය මුළු ලාභයට සමාන වූ බවයි.

(4) ආයතනය ප්‍රාමාණික ලාභ ලබන මට්ටමක සිටින බවයි.

(5) ආයතනයට භාණ්ඩයේ විචල්‍ය පිරිවැය පියවාගත නොහැකි බවයි. (........)

(21) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේදී 'හීනවන පලදාව' හටගැනීමට හේතුවක් වන්නේ මින් කවර සංරෝධකයද?

(1) විචල්‍ය යෙදවුම් වැඩි වීම.

(2) ස්ථාවර යෙදවුම් වැඩි වීම.

(3) විචල්‍ය පිරිවැය අඩු වීම.

(4) මුළු යෙදවුම් වැඩි වීම.

(5) ස්ථාවර යෙදවුම් වෙනස්කළ නොහැකි වීම. (........)

(22) විවෘත ආර්ථිකයක සමතුලිතය ප්‍රකාශ වන්නේ,

(1) $y = C + I + G + X - M$

(2) $y = C + I + G$

(3) $y = C + I$

(4) $S = I$

(5) $S + T + I + G$ (........)

(23) දළ දේශීය නිෂ්පාදිතය මත කරන වියදම දැක්වෙන්නේ,

(1) සාධක ආදායම් + ක්ෂයවීම්

(2) මුළු පරිභෝජන වියදම + ආයෝජන වියදම

(3) දළ දේශීය නිෂ්පාදිතය - ක්ෂය වීම

(4) දළ දේශීය වියදම + විදේශ ශුද්ධ සාධක ආදායම

(5) දළ දේශිය වියදම + ශුද්ධ අපනයන (........)

(24) කිසියම් කාලපරිච්ඡේදයක් තුළ රටක සාධක ඉපයුම්වල අගය සමාන වන්නේ,

(1) ශුද්ධ දේශීය නිෂ්පාදිතයටයි.

(2) දළ දේශීය නිෂ්පාදිතයටයි.

(3) දළ දේශීය ආදායමටයි.

(4) ශුද්ධ ජාතික ආදායමටයි.

www.artsapi.lk

(5) දළ ජාතික ආදයමටයි. (........)

(25) විවෘත ආර්ථික පරිභෝජන ශ්‍රිතය = C 300 + 0.75 yd වන අතර T = 20 නම්, ඉතුරුම් ශ්‍රිතය වන්නේ,

(1) S = 300 + 0.25 y
(2) S = -285 + 0.25 y
(3) S = -315.50 + 0.75 y
(4) S.315 + 0.25 y
(5) S = 285 + 0.75y (........)

(26) සංවෘත ආර්ථිකයක පරිභෝජනය C = 150 + 0.75 y නම් ආයෝජන ගුණකය වන්නේ,

(1) 0.25 (2) 4 (3) -4 (4) 0.75 (5) 75 (........)

(27) ආර්ථික පරිභෝජන ශ්‍රිතය 300 + 0.8yd ද, ආයෝජන 50 හා සංක්‍රාම ආදායම් 100 වේ නම් මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම වන්නේ (රු. මි. වලින්)

(1) 2150 (2) 1650 (3) 1500 (4) 525 (5) 1525 (........)

(28) පෞද්ගලික භාණ්ඩයක ලක්ෂණයක් ලෙස හැඳින්විය හැක්කේ පහත ලක්ෂණ අතරින් කවරෙක්ද?

(1) පරිභෝජනයේ තරගකාරී වීම හා ගෙවීමක් කරන පුද්ගලයාට පරිභෝජනය හා එහි ප්‍රතිලාභ හිමිවීම.
(2) ප්‍රතිලාභ ගෝලීය ප්‍රජාවටම භුක්ති විඳිය හැකි වීම.
(3) පරිභෝජනය තරගකාරීවීම හා පරිභෝජනය වැළැක්විය හැකි වීම.
(4) එක් අයකුගේ පරිභෝජනයෙන් තවත් කෙනෙකුට පරිභෝජනය අහිමි නොවේ.
(5) පරිභෝජනයේ තරගකාරීත්වයක් ඇති එහෙත් පරිභෝජනය වැළැක්විය නොහැකි වේ. (........)

(29) ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකු සමග නිත්‍ය තැන්පතු ගිවිසුම් (ප්‍රති ගැණුම් ගිවිසුම්) ඇති කරගත් විට,

(1) මහ බැංකුවේ ද්‍රවශීල වත්කම් ඉහළ යයි.
(2) නිත්‍ය පොලී අනුපාත කොරිඩෝවේ පොලී අනුපාතයේ පහළ සීමාව තීරණය වේ.
(3) නිත්‍ය පොලී අනුපාත කොරිඩෝවේ පොලී අනුපාතයේ ඉහළ සීමාව තීරණය වේ.
(4) වාණිජ බැංකුවල ද්‍රවශීලතාවය තීරණය වේ.
(5) වාණිජ බැංකුවල ණය මුදල් ඉල්ලුම තීරණය වේ. (........)

(30) වාණිජ බැංකු තම මුදල් අවශ්‍යතා සඳහා ක්ෂණික ණය මුදල් වෙළඳපොළෙන් ලබාගන්නා මුදල් පියවීම කළ යුතු කාලය වන්නේ,

(1) දෙදිනක් තුළ පියවිය යුතුයි.
(2) එක් දිනකින් එය පියවිය යුතුයි.
(3) සතියකින් පියවිය යුතුයි.
(4) මාස තුනකින් පියවිය යුතුයි.
(5) ද්‍රවශීලතාවය යහපත් වූ විට එය පියවීම කළහැක. (........)

(31) හුවමාරු ආර්ථිකය බිඳවැටීමට ප්‍රධාන සාධකයක් වූයේ,

(1) ගෙනයාමේ අපහසුව
(2) අවශ්‍යතාවල ද්විසම්පාතයක් තිබිය යුතු වීම.
(3) ගබඩා කිරීමේ අපහසුව
(4) ආරක්ෂා කිරීමේ පහසුව
(5) පසුගිය ණය ගෙවීමේ අපහසුව (........)

(32) ආර්ථිකයක පදනම මුදල් හෙවත් අධිබලැති මුදල් ලෙස හඳුන්වන්නේ,

(1) ඉතුරුම් හා කාලීන තැන්පතුය.
(2) විශුද්ධිකරණය කර ආර්ථිකයට එක්කළ කළු මුදල්
(3) මහජනයා හා වාණිජ බැංකු වලඇති ව්‍යවහාර මුදල් හා වාණිජ බැංකු සතු මහ බැංකුවේ ඇති තැන්පතු
(4) මහජනයා සතු ව්‍යවහාර මුදල් හා වාණිජ බැංකු සතු ඉතුරුම් තැන්පතු

www.artsapi.lk

(5) මහජනයා සතු ව්‍යවහාර මුදල් හා බලපත්‍රලාභී මූල්‍ය ආයතන සතු වත්කම්. (........)

(33) මූල්‍ය වෙළඳපොළේ ගනුදෙනු කිරීම සඳහා යොදා ගනු ලබන මූල්‍ය උපකරණ වන්නේ මින් කවරක්ද?

(1) තැන්පතු, ණය හා සමාගම් කොටස්
(2) තැන්පතු, ණය හා රුපියල් ණය සුරැකුම්පත්
(3) භාණ්ඩාගාර බිල්පත්, ණය, භාණ්ඩාගාර බැඳුම්කර
(4) ණයකර, සමාගම් කොටස්, ණය
(5) තැන්පතු, ණයකර හා සමාගම්වල සාමාන්‍ය කොටස් (........)

(34) ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්තමාන අරමුණක් ලෙස පැහැදිලිව දක්වා ඇත්තේ මින් කවරෙක්ද?

(1) මිල සහ ආර්ථික ස්ථායිතාවය පවත්වා ගැනීම.
(2) ඵලදායී ලෙස සම්පත් පූර්ණ වශයෙන් සංවර්ධනය.
(3) නිෂ්පාදනය හා සේවා නියුක්තිය, මූර්ත නිෂ්පාදනය නැංවීම.
(4) දේශීය මුදලේ අගය ආරක්ෂා කිරීම.
(5) දේශීය මුදලේ විදේශ අගය ආරක්ෂා කිරීම. (........)

(35) ආර්ථිකය තුළ ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයක් හට ගැනීමට හේතුවිය හැකි සාධකයක් වන්නේ,

(1) රටේ වාණිජ බැංකුවල ණය දීම ඉහළ යාම.
(2) ආනයන කරන ලද බණිජ තෙල් මිල ඉහළ යාම.
(3) රජයේ සේවකයන්ගේ වැටුප් වැඩිවීම් පාලනය කිරීම.
(4) ආනයනය කරන ලද නිෂ්පාදන සම්පත්වලට බදු පැනවීම.
(5) මහ බැංකුව විවෘත වෙළඳපොළේ සුරැකුම්පත් විකිණීම. (........)

(36) ආර්ථිකය තුළ මුදල් සැපයුම ප්‍රසාරණය කිරීම සඳහා මහ බැංකුව ක්‍රියාත්මක කරන උපක්‍රමයක් වන්නේ,

(1) වාණිජ බැංකුවල ණය දීම පහළ දැමීම.
(2) ප්‍රතිපත්ති පොලී අනුපාතිකය අඩු කිරීම.
(3) මහ බැංකුව විවෘත වෙළඳපොළේ සුරැකුම්පත් විකිණීම.
(4) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය ඉහළ දැමීම.
(5) මූල්‍ය ආයතනවලින් ණය දීම වැඩි කිරීම. (........)

(37) ආර්ථිකයක් තුළ සාධාරණත්වය හෙවත් ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩුකිරීමට බදුකරණයේදී යොදාගනු ලබන්නේ,

(1) අනුක්‍රමික බද්ද ඇතුළත් කිරීම හා රජයේ වියදම් තුළට සංග්‍රාම වියදම් ඇතුලත් කිරිමයි.
(2) සමානුපාතික බද්ද ඇතුලත් කිරීම හා රජයේ වියදම් තුළට සංග්‍රාම වියදම් ඇතුලත් කිරිම.
(3) ප්‍රතික්‍රමික බද්ද ඇතුලත් කිරීම හා රජය වියදම් තුළට සංග්‍රාම වියදම් ඇතුලත් කිරීම.
(4) අනුක්‍රමික බද්ද ඇතුලත් කිරීම හා සංග්‍රාම වියදම් අඩු කිරීම.
(5) ප්‍රතික්‍රම බද්ද ඇතුලත් කිරීම හා තෝරාගත් ආර්ථික කටයුතුවලට සහනාධාර ලබා දීම. (........)

(38) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම තුළ 'වක්‍ර බදු' වලින් වැඩිම ආදායමක් එකතු කරනු ලබන්නේ,

(1) ආදායම් හා ධනබදු මගින් ය.
(2) දේපොළ ආදායම් හා පොලී ආදායම් මගින් ය.
(3) විදේශීය වෙළඳාම මත අයකරන බදු හා සෙස් බදු මගින් ය.

www.artsapi.lk

(4) නිෂ්පාදන බදු හා වරාය, ගුවන්තොටුපල බදු මගින් ය.
(5) එකතුකළ අගය මත පනවන බදු හා නිෂ්පාදන බදු මගින් ය. (........)

(39) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ලබාගැනීම සඳහා යොදාගනු ලබන 'ජාතිය ගොඩනැගීමේබැඳුම්කර' ලෙස හඳුන්වන්නේ,
(1) විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලාංකික පුරවැසියන්ට දේශිය ණය ලබාගත හැකි උපකරණයකි.
(2) දේශීය ව්‍යවහාර මුදලින් විදේශිකයන්ට ණය ලබාගත හැකි උපකරණයකි.
(3) විදේශීය ව්‍යවහාර මුදලින් විදේශිකයන්ට ණය ලබාගත හැකි උපකරණයකි.
(4) වර්ෂයක පරිනත කාලයක් සඳහා ඇ. එ. ජ. ඩොලර් මගින් ණය ලබා ගතහැකි නව උපකරණයකි.
(5) දිගුකාලීන හා මධ්‍යකාලීන විදේශිකයන්ට ලබාගත හැකි ණය උපකරණයකි. (........)

(40) රාජ්‍ය අයවැය ලේඛනයක වර්තන ගිණුමේ 'හිගයක්' මගින් පැහැදිලිවන්නේ එරටේ,
(1) වර්තන වියදම් පියවා ගැනීමට මුළු අයභාරය ප්‍රමාණවත් නොවන බවයි.
(2) ආණ්ඩුවේ රාජ්‍ය ඉතුරුම් ධන බවයි.
(3) ප්‍රාග්ධන වියදම් පහලයාමක් සිදු ව ඇති බවයි.
(4) ප්‍රාග්ධන වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් අයභාරයක් නොමැති බවයි.
(5) වර්තන හා ප්‍රාග්ධන වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් අයභාරයක් නොමැති බවයි. (........)

(41) බද්දක් පැනවීම තුළින් වෙළඳපොළ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපෑම් ඇතිකරයි නම් (විකෘති) එයින් පැහැදිලි වන්නේ.
(1) ආර්ථිකයේ සම්පත් බෙදා හැරීමේ ක්‍රියාවලියට හිතකර වූ බවයි.
(2) බදු ක්‍රමයේ මධ්‍යස්ථභාවය ආරක්ෂා වී ඇති බවයි.
(3) වෙළඳපොළ ක්‍රියාවලියට අධි බදුබරක් ඇති නොවන බවයි.
(4) වෙළඳපොළ ක්‍රියාවලියට අධි බදු බරක් ඇති වූ බවයි.
(5) නිෂ්පාදන හා පාරිභෝගික අතිරික්තය වැඩි වූ බවයි. (........)

(42) ආර්ථිකයක රාජ්‍ය බදු, වියදම්, රාජ්‍ය ණය හා අයවැය හැසිරවීම මගින් ආර්ථික විචල්‍යන්ට බලපෑම් කිරීම හැදින්විය හැක්කේ,
(1) මූල්‍ය ප්‍රතිපත්ති ලෙසය. (2) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ලෙස
(3) ඍජු පාලන ප්‍රතිපත්ති ලෙස (4) විදේශීය වෙළඳ ප්‍රතිපත්ති ලෙස
(5) සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති ලෙස (........)

(43) රාජ්‍ය අයවැය ලේඛනයක් පියවා ගැනිමේදී 'මුදල් සැපයුමට' බලපෑමක් සිදුවිය හැකි මූලාශ්‍රයක් වන්නේ මින් කුමක්ද?
(1) ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ණය ගැනිමේදී
(2) බැංකු පද්ධතියෙන් ණය ලබා ගැනිමේදී
(3) සේවක අර්ථසාධක අරමුදලෙන් ණය ගැනිමේදී
(4) පරිපාලන ණය ගැනිමේදී
(5) විශ්‍රාම වැටුප් හා සේවක භාරකාර අරමුදලෙන් ණය ගැනිමේදී (........)

(44) සාර්ව ආර්ථික අරමුණක් වන 'බාහිර සමතුලිතතාවය' යනුවෙන් අදහස් වන්නේ,
(1) ගෙවුම් ශේෂ ලේඛනයේ අසමතුලිතතාවය හා දේශීය මුදලේ අගය ආරක්ෂා කිරීමයි.
(2) ගෙවුම් ශේෂ ලේඛනයේ අසමතුලිතතාවය හා බාහිර මුදලේ අගය ආරක්ෂා කිරීමයි.
(3) ගෙවුම් ශේෂ ලේඛනයේ අසමතුලිතතාවය හා ආදායම් බෙදී යාමේ විෂමතාවය ආරක්ෂා කිරීමයි.

www.artsapi.lk

(4) ගෙවුම් ශේෂ ලේඛනයේ අසමතුලිතතාවය හා උද්ධමනය පාලනය කිරීමයි.

(5) ගෙවුම් ශේෂ ලේඛනයේ අසමතුලිතතාවය හා අභ්‍යන්තර හා බාහිර මුදලේ අගය ආරක්ෂා කිරීමයි.

(........)

(45) විදේශීය වෙළඳාමේ තීරුබදු නොවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ගයක් වශයෙන් 'ප්‍රපතනය' යන සංකල්පයෙන් අදහස් කරන්නේ,

(1) දේශීය වෙළඳපොළේ අලෙවිකරණ මිලට වඩා අඩු මිලකට යම් භාණ්ඩයක් විදේශ වෙළෙඳපළෙහි අලෙවි කිරීම.

(2) දේශීය වෙළඳපොළේ අලෙවිකරණ මිලට වඩා වැඩි මිලකට යම් භාණ්ඩයක් විදේශ වෙළෙඳපොළෙහි අලෙවි කිරීම.

(3) විදේශ විනිමය අනුපාතිකයේ සිදුවන වෙනස්කම් ගැලපීමෙන් විදේශ වෙළඳපොළේ භාණ්ඩ අලෙවි කිරීම.

(4) සාපේක්ෂ පිරිවැය මත අඩු මිලකට විදේශ වෙළඳපොළේ යම් භාණ්ඩයක් අලෙවි කිරීම.

(5) නිරපේක්ෂ වාසිය මත යම් භාණ්ඩයක් අඩු මිලට විදේශ වෙළඳපොළේ අලෙවි කිරීම. (........)

(46) හිඟ අයවැයක් දිගින් දිගටම ආර්ථිකයක් තුළ පැවතිමෙන් ඇතිවන අහිතකර ප්‍රතිවිපාකයක් වන්නේ මින් කවරෙක්ද?

(1) උද්ධමන ප්‍රතිවිපාක අඩු වීම.

(2) පෞද්ගලික අංශයේ ආයෝජන අධෛර්යමත් වීම.

(3) සාර්ව ආර්ථිකය ස්ථායිකරණයක ස්වයංක්‍රීයව හට ගැනීම.

(4) බදු බර අඩු වීම.

(5) රාජ්‍ය ණය බර අඩු වීම. (........)

(47) රජයක් තම රටේ වර්තන වියදම් අඩුකළ විට සිදුවිය හැකි වඩාත් අනර්ථකාරී ප්‍රතිවිපාකයකි.

(1) වර්තමාන සමාජ ශුභ සාධනයට අහිතකර වීම.

(2) සමාජ ශුභ සාධනය ඉහළ යාම.

(3) විසර්ජන කෙටුම්පත ප්‍රතික්ෂේප වීම.

(4) වර්තමානයේ ප්‍රාග්ධන වියදම් ඉහළ යාම.

(5) අනාගත පරිභෝජන මට්ටම ඉහළ යාම. (........)

(48) ගෙවුම් ශේෂ ලේඛනයේ ප්‍රාථමික ආදායම් ගිනුමේ සටහන්වන ගනුදෙනුවක් වශයෙන් දැක්විය හැක්කේ,

(1) කළඹ ආයෝජන (2) ප්‍රාග්ධන ක්ෂය

(3) සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ (4) ආයෝජන ආදායම්

(5) රක්ෂණ ලැබීම් (........)

(49) වෙළඳ අනුපාතිකය යහපත් විය හැක්කේ පහත සඳහන් කුමන අවස්ථාවකදීද?

(1) ආනයන වටිනාකමට වඩා වැඩි වේගයකින් අපනයන වටිනාකම වැඩි වූ විටකදී ය.

(2) අපනයන වටිනාකමට වඩා වැඩි වේගයකින් ආනයන වටිනාකම වැඩි වූ විටකදී ය.

(3) විනිමය අනුපාතිකය අධිතක්සේරු වූ විටකදී ය.

(4) විනිමය අනුපාතිකය ක්ෂයවීමක් සිදු වූ විටකදී ය.

(5) ආනයන මිල දර්ශනය වැඩිවෙන වේගයට වඩා අඩු වේගයකින් අපනයන පරිමාව වැඩි වූ විටකදීය.

(........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ආර්ථික විද්‍යාව - II

13 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- 'අ', 'ආ' කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න 02 බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## 'අ' කොටස

01. (1) ආර්ථික සම්පත් යන්න පැහැදිලි කර උදාහරණ 2 ක් සපයන්න.

(2) භූමිය හා එහි අන්තර්ගත සම්පත් තුළ ප්‍රතිස්ථාපනය කළ හැකි සම්පත් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? උදාහරණ සපයන්න.

(3) ඕනෑම ආර්ථික පද්ධතියක් තාක්ෂණික වශයෙන් ඉහළ නිෂ්පාදන මට්ටමක් අත්පත් කර ගත්තද 'හිඟකම' නොවිසඳේ. එසේ වන්නේ ඇයි ? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(4) ඕනෑම සමාජ ආර්ථික පද්ධතියකට තේරීම් ගැටළුවකට මුහුණපෑමට සිදුවන්නේ ඇයි ? එම තේරීම් ප්‍රශ්ණ කවරේද?

(5) සමහර අවස්ථාවලදී ස්වභාවික භාණ්ඩ පවා ආර්ථික භාණ්ඩ වන අවස්ථා දැකිය හැකිය. පැහැදිලි කරන්න.

02. (1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යන්න නිර්වචනය කර නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇඳීමේදී පාදක කරගනු ලබන සාධක කවරේද?

(2) වැඩෙන ආවස්ථික පිරිවැයක් සහිත නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මගින් පහත සිදුවීම් දක්වා ඒවා පැහැදිලි කරන්න.

1. ආර්ථික සම්බාධක පැනවීමක් නිසා කාර්මික අංශයේ කර්මාන්තවල නිෂ්පාදනයේ පහළ යාම
2. කෘෂි අංශයේ නිෂ්පාදන ඵලදායිතාව ඉහළ යාම
3. ආර්ථික වෘද්ධියක් හටගැනිම.
4. අභ්‍යන්තර සිවිල් ගැටුම් නිසා ආර්ථිකයේ සම්පත් විනාශ වීම

(3) යම් ආර්ථිකයකට තම විභව නිමැවුම ඉක්මවූ සැබෑ නිමැවුමක් අත්පත්කර ගත හැකිද? උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(4) වැඩෙන ආවස්ථික පිරිවැය පැහැදිලි කර වැඩෙන ආවස්ථික පරිවැයක් හටගැනීමට හේතුවන කරුණු නම් කරන්න.

www.artsapi.lk

03. (1) ආර්ථික පද්ධති විවිධත්වයක් වීම කෙරේ බලපාන නිර්නායක කවරේද?

(2) වෙළඳපොළ ආර්ථිකයේ හැමවිටම භාණ්ඩ හා සේවා නිෂ්පාදන කිරීමේ හා බෙදා හැරීමේ ක්‍රියාවලියේදී 'වෙළඳපොළ යාන්ත්‍රණය ප්‍රසංසනීය නොවේ.' ඔබ එකඟවන්නේද? පිළිතුර පැහැදිලි කරන්න.

(3) ඕනෑම ආර්ථික පද්ධතියක් තම ආර්ථිකයේ සාධන මට්ටම මැනීම සඳහා යොදාගනු ලබන නිර්නායක කවරේද?

(4) වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ 'මිලට' වැදගත් කාර්ය භාරයක් ඇත. එම කාර්ය මොනාවද?

(5) මූලික ආර්ථික ප්‍රශ්නයක් වන 'කෙසේ නිෂ්පාදනය කරන්නේද යන්න වෙළඳපොළ ආර්ථිකයක් හා විධාන ආර්ථිකයක් විසඳාගනු ලබන්නේ කෙසේද?

04. එක්තරා භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිතයන් පහත දැක්වේ. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

$Qd = 600 - 10P$ $Qs = 10P$

(1) සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

(2) මෙම භාණ්ඩය මත රු. 10.00 සහනාධාරයක් රජය විසින් ලබා දෙන ලදී. සහනාධාරයෙන් පසු පාරිභෝගිකයා ගෙවන මිල කොපමණද?

(3) සහනාධාරයෙන් පසු නිෂ්පාදකයාට වන මිල කොපමණද?

(4) සහනාධාරයට පසු නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න.

(5) සහනාධාරයෙන් පසු නිෂ්පාදන අතිරික්තයේ වෙනස කොපමණද?

05. පූර්ණ තරගකාරී කෙටිකාලීන නිෂ්පාදන ආයතනයකට අදාළ පිරිවැය වක්‍ර පහත දැක්වේ.




www.artsapi.lk

(1) ආර්ථික ලාභය ගණනය කරන්න.

(2) මෙම නිෂ්පාදන ආයතනයට නිෂ්පාදන කටයුතු වල නිරතවිය හැකිද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(3) කෙටිකාලීන නිෂ්පාදන ආයතනයක් නිෂ්පාදනයේ යෙදී සිටීම සඳහා අවශ්‍යයෙන්ම පියවිය යුතු පිරිවැය කවරේද?

(4) මෙම ආයතනයට භාණ්ඩය නිපදවිය හැකි අවම මිල කවරේද?

(5) නිෂ්පාදන ආයතනයේ ස්ථාවර පිරිවැය කීයද?

(6) කෙටිකාලීන නිෂ්පාදන ආයතනයක ස්ථාවර පිරිවැය නිෂ්පාදනය අත්හිටුවීමෙන් වැළක්විය හැකිය යන ප්‍රකාශය පැහැදිලි කරන්න.

## 'ආ' කොටස

06. (1) ජාතික ආදායම ගණනය කිරීමේදී 'සංග්‍රාම ආදායම්' බැහැර කරනු ලබන්නේ කවර කරුණක් නිසාද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(2) එක්තරා ආර්ථිකයක 2010 වර්ෂයේ ගණනය කරන ලද දළ ජාතික නිෂ්පාදිතයේ අගය මූර්ත දළ ජාතික නිෂ්පාදනයේ අගයට වඩා වැඩි අගයක් ගන්නා ලදී. මෙසේ වෙනස්වීමට හේතු වූ සාධක පැහැදිලි කරන්න.

(3) සමහර වියදම් ඇතුලත් සංරචක මොනවාද?

(4) එක්තරා කල්පිත ආර්ථිකයක් පිළිබඳ තොරතුරු ඔබට සපයා ඇත.

| | | |
|---|---|---|
| | C | $= 100 + 0.8y$ |
| | I | $= 200$ |
| | G | $= 160$ |
| අපනයන | X | $= 60$ |
| ආනයන | M | $= 180$ |
| බදු | T | $= 140$ |

ඉහත දත්ත ආශ්‍රයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(i) ඉතුරුම් ශ්‍රිතය ගණනය කරන්න.

(ii) දළ දේශීය වියදම ගණනය කරන්න.

(iii) දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න.

(iv) y= රු. මි. 1700 ඉතුරුම් ප්‍රමාණය ගණනය කරන්න.

(v) වියදම් හා කාන්දුවීම් මත ආර්ථිකයේ සමතුලිත ජාතික ආදයම ලියා දක්වන්න.

(vi) රාජ්‍ය අයවැය හිඟය ගණනය කරන්න.

www.artsapi.lk

07. (1) හුවමාරු කිරීමේ මාධ්‍යයක් වශයෙන් මුදලේ කාර්යන් කවරේද?

(2) මුදල් සඳහා පුද්ගලයින් ඉල්ලුම්කරනු ලබන්නේ ඇයි? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(3) අධි බලැති මුදල් හෙවත් පදනම් මුදල් පැහැදිලි කර එහි වැදගත්කම දක්වන්න.

(4) මුදල් සැපයුම අර්ථ දක්වා ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමේ අන්තර්ගතය ලියා දක්වන්න.

(5) වාණිජ බැංකුවක මුදල් මැවීමේ හැකියාව සීමා කළහැකි සාධක කවරේද?

08. (1) ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටකට විදේශ ආයෝජනවල වැදගත්කම පැහැදිලි කරන්න.

(2) ඍජු ආයෝජන හා කළඹ අයෝජන යන සංකල්ප පැහැදිලි කරන්න.

(3) මූර්ත විනිමය අනුපාතිකය හා මූර්ත සපල විනිමය අතර වෙනස පැහැදිලි කරන්න.

(4) රාජ්‍ය ණය පැහැදිලි කර ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය නිසා ආර්ථිකයට සිදුවන ප්‍රතිවිපාක කවරේද?

(5) විසර්ජන කෙටුම්පත හා විසර්ජන පනත යන්න පැහැදිලි කරන්න.

09. (1) ජාත්‍යන්තර වෙළඳාම විග්‍රහ කෙරෙන නිරපේක්ෂ වාසි න්‍යාය හා සාපේක්ෂ න්‍යාය පැහැදිලි කරන්න.

(2) ශ්‍රී ලංකාවේ සහ චීනයේ සහල් හා රෙදි නිෂ්පාදනයට අදාළ ශ්‍රම ඒකකයකට නිමැවුම ඔබට සපයා ඇත. අදාළ දත්ත ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

| | ශ්‍රී ලංකාව | චීනය |
|---|---|---|
| සහල් | 2 | 10 |
| රෙදි | 5 | 6 |

(අ) ශ්‍රී ලංකාවේ සහ චීනයේ සහල් හා රෙදි නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ආවස්ථික පිරිවැය ගණනය කරන්න.

(ආ) සහල් හා රෙදි නිෂ්පාදනය සම්බන්ධව නිරපේක්ෂ වාසි ඇත්තේ කුමන රටවලටද?

(ඉ) සහල් සහ රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටවලටද?

(ඊ) සහල් හා රෙදි විශේෂ ප්‍රාගුණ්‍ය කළ යුත්තේ කුමන රටද?

(උ) විදේශ වෙළඳාමට පිවිසීමේදී ජාත්‍යන්තර හුවමාරු වෙළඳ අනුපාතය කවරේද?

www.artsapi.lk